**ජනතා වතු සංවර්ධන මණ්ඩලය - 2018**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 ව්‍යාචනය කළ මතය

ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙහි 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ ව්‍යාචනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය විසින් 2012 සැප්තැම්බර් 21 දිනැතිව රු.2,500,000ක ස්ථාවර තැන්පතුවල කරන ලද ආයෝජනය 2018 දෙසැම්බර් 31 දින වන විට රු. 4,326,092 ක් දක්වා වර්ධනය වී තිබුණ ද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 1හි 66 වගන්තිය ප්‍රකාරව එම තැන්පතුවේ වටිනාකම ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත විය යුතු වුවත්, ජංගම වත්කම් යටතේ ගිණුම් ගත කර තිබුණි. | 2019 වර්ෂයේ සිට නිවැරදිව වාර්තාකරණය සිදුකර ඉදිරිපත් කරනු ඇත. | ප්‍රමිතය ප්‍රකාරව ස්ථාවර තැම්පතු නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) 07හි ඡේද අංක 7.අ,ආ අනුව ඇප තැබූ වත්කම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් සිදු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මහජන බැංකුවේ යූනියන් පෙදෙස ශාඛාවේ විවෘත කර තිබූ රු.2,500,000 ක ස්ථාවර තැන්පතුව හා වොක්ෂෝල් වීදිය, කොළඹ 02, දරන ලිපිනයේ පිහිටි ඉඩම, ලංකා බැංකු හයිඩ්පාර්ක් ශාඛාවේ ස්ථාවර බැංකු අයිරා පහසුකමක් ලබා ගැනීම සඳහා ඇප තැබීම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අදාල ප්‍රමිතිය ප්‍රකාරව අවශ්‍ය හෙළිදරව් කිරිම් සිදු කර නොතිබුණි. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය තුළින් මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 07 අනුව හෙළිදරව් කර ඉදිරිපත් කරනු ඇත. | ප්‍රමිතය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07 හි 20ඡේද ප්‍රකාරව වක්‍ර ක්‍රමය අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වන ශුද්ධ මුදල් ප්‍රවාහය ආයතනයේ සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභයට හෝ අලාභයට, ගැලපීම් සිදු කළ යුතු වුව ද, එයට පටහැනිව මණ්ඩලය විසින් සමුච්චිත පාඩුවෙහි වෙනස වන රු.608,391,269 කට එම ගැලපීම් සිදුකර තිබුණි. | එකඟ වී ඇත. | ප්‍රමිතය ප්‍රකාරව මුදල් ප්‍රවාහය සකස් කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි 42,43 හා 49 ඡේද ප්‍රකාරව පෙර වර්ෂවලදී සිදු වූ වැරදි අතීතානුයෝගීව ගැලපීමෙන් පසු සමාලෝචිත වර්ෂය සමඟ ඉදිරිපත් කරන සංසන්දනාත්මක තොරතුරු නිවැරදි කර ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන තුළ සිදු කළ යුතු නමුත්, මණ්ඩලය විසින් 2017 වර්ෂයේ වත්කම් සහ හිමිකම් තුළ සිදුකරන ලද රු.7,469,668 ක එවැනි ගැලපීම් පිළිබඳව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි. | එකඟ වී ඇත. | ප්‍රමිතය ප්‍රකාරව සංසන්දනාත්මක තොරතුරු ප්‍රමාණවත් පරිදි මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) 13 හි 37ඡේදය ප්‍රකාරව වර්ෂ ගණනාවක සිට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.935,509 ක් ලෙස දක්වා ඇති මණ්ඩලයේ වතු 17 කට අයත් හෙක්ටයාර 12,331ක් වූ සින්නක්කර ඉඩම් සාධාරණ අගයට තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණු බැවින් ස්ථාවර වත්කම් ඌන තක්සේරු වී ඇති බව නිරීක්ෂණය විය. | ඉඩම් වල වටිනාකම සාධාරණ අගයකට ගිණුම් ගත කර නැත. | ප්‍රමිතය ප්‍රකාරව ඉඩම් සාධාරණ අගයට තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 37 ඡේදයට අනුව එක සමාන ස්වභාවයක් හා භාවිතයක් පවතින වත්කම් පමණක් කාණ්ඩ කර ගිණුම්ගත කළ යුතු බව දක්වා තිබුණද එයට පටහැනිව මණ්ඩලය විසින් යන්ත්‍රෝපකරණ ,කාර්යාල උපකරණ හා වාහන යන අයිතමයන් සියල්ලම එකම අයිතමයක් යටතේ මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. | ප්‍රමිති ප්‍රකාරව දැක්වීම 2019 ගිණුම් වර්ෂයේදී ඉදිරිපත් කරනු ඇත. | ප්‍රමිතය ප්‍රකාරව වත්කම්වල ස්වභාවය අනුව කාණ්ඩ කර ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 73 (ඇ) ඡේදය අනුව වතුයායන් හා ප්‍රධාන කාර්යාලය තුළ පවතින වත්කම් 13 කට අදාල ක්ෂය අනුපාතය මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කර නොතිබුණි. මේ හේතුවෙන් මෙම වත්කම්හි ක්ෂය ගණනය කිරීමේ නිවැරදිතාවය පරීක්ෂා කිරීමට නොහැකිව ඇත. | වත්කම් 13 හි අදාල ක්ෂය අනුපාතයන් මූල්‍ය ප්‍රකාශනය තුළින් ඉදිරිපත් කිරීම 2019 වර්ෂයේ සංශෝධන ගිණුම් තුළින් නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | වත්කම්වලට අදාල ක්ෂය අනුපාතයන් මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 හි 57 වන ඡේදය ප්‍රකාරව අස්ථිත්වයේ සේවා ප්‍රතිලාභ බැඳීම ගණනයේදී ආයුගණන ක්‍රමය එනම් අස්ථිත්වයේ වර්තමාන සේවා පිරිවැය, සේවකයින්ගේ වයස් ප්‍රමාණය, සේවකයින්ගේ ආයු අපේක්ෂණය, සේවා පිරිවැටුමට වූ බලපෑම, විශ්‍රාම වයස, වට්ටම් අනුපාතය, වැටුප් හා වර්ධන ප්‍රතිශතය වැනි උපකල්පන යොදාගෙන ගණනය කිරීම් කළ යුතු වුවත්, මණ්ඩලය විසින් සිය ප්‍රතිලාභ ගණනයේදී ඉහත ආයුගණන ක්‍රමය යොදාගෙන නොතිබුණි. | ඉදිරි කාලයේදී ආයු ගණන ක්‍රමය යොදා ගැනීමට කටයුතු කරනු ඇත. | ප්‍රමිතය ප්‍රකාරව සේවා ප්‍රතිලාභ බැඳීම් ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 41 හි 54 (ඉ) ධාරක ජීව විද්‍යාත්මක වත්කම් සම්බන්ධයෙන් ප්‍රයෝජනවත් ආයු කාලය හෝ භාවිතා කළ ක්ෂයවීමේ ප්‍රතිශතය මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී තේ, රබර් හා වෙනත් වගාවන් සඳහා ක්‍රමක්ෂය ගැලපීම් සිදු කර තිබුණද, මූල්‍ය ප්‍රකාශන තුළ ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය හා ක්ෂය අනුපාතය හෙළිදරව් කර නොතිබුණි .මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වටිනාකමෙහි නිවැරදිතාවය පරීක්ෂා කළ නොහැකි විය. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය තුළින් ප්‍රමිත අංක 41 හි 54 (ඉ) ට අනුව ක්ෂය කිරීමේ ප්‍රතිශතයන් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රමිතය ප්‍රකාරව ධාරක ජීව විද්‍යාත්මක වත්කම්වල ක්ෂය අනුපාතය හෝ ප්‍රයෝජනවත් ජීව කාලය මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළ යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 41 හි 12 ඡේදය ප්‍රකාරව ජීව විද්‍යාත්මක වත්කම් මූලික හඳුනා ගැනීමේදී සහ සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදීම විකුණුම් සඳහා වියදම් අඩුකළ පසු සාධාරණ වටිනාකමට මැනිය යුතු වුවත්, දැව වගාව එලෙස තක්සේරු කර මණ්ඩලය විසින් ගිණුම්ගතකර නොතිබුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 41 ප්‍රකාරව දැව වගාව තක්සේරු කර ජීව විද්‍යාත්මක වත්කමක් ලෙස ගිණුම් ගත කර නැත. ජීව විද්‍යාත්මක වත්කම් අගය වැඩිවීම ආයතනයේ පැවැත්මට ශක්තියක් බැවින් අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය මත දැව වගාව තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රමිතය ප්‍රකාරව ජීව විද්‍යාත්මක වත්කම්වල සාධාරණ වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |

## 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයේ ක්ෂය ප්‍රතිපත්තිය ලෙස වත්කම මිලදී ගත් දිනයේ සිට වත්කම් ක්ෂය කිරීම ආරම්භ කරන බව මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණද 2018 , වර්ෂය තුළදී වතුයායන් විසින් මිලදී ගන්නා ලද ස්ථාවර වත්කම් මිලදී ගත් දිනය නොසලකා සමාලෝචිත වර්ෂය පුරාම ක්ෂය කර තිබුණු අතර, ස්ථාවර වත්කම් ලේඛනය තුළ මිලදී ගත් දිනයක් සඳහන්ව නොතිබුණි. මේ හේතුවෙන් වතුයායන්හි සමාලෝචිත වර්ෂයේ නිවැරදි ක්ෂය ප්‍රමාණය ගණනය කිරීමේ හැකියාවක් නොතිබුණි. | පිළිගනිමි. වර්ෂය තුළදී මිලදී ගන්නා ලද ස්ථාවර වත්කම් ක්ෂය කිරීම කාලානුරූපීව ක්ෂය කිරීමට 2022 වර්ෂයේ සිට කටයුතු කරනු ඇත. | මණ්ඩලයේ ක්ෂය ප්‍රතිපත්තිය අනුව ක්ෂය ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | මණ්ඩලයේ ක්ෂය ප්‍රතිපත්තිය යටතේ වතුයායන් හා ප්‍රධාන කාර්යාලය සඳහා යන්ත්‍රසූත්‍ර සහ පරිගණක සහ පරිගණක මුද්‍රණ යන්ත්‍ර යන වත්කම් සඳහා පැරණි හා නව වත්කම්වලට එක් ක්ෂය අනුපාතයක් භාවිතා නොකර ක්ෂය අනුපාත දෙකක් භාවිතා කරන බව නිරීක්ෂණ විය. මේ අනුව මණ්ඩලය නිශ්චිත ක්ෂය ප්‍රතිපත්තියක් භාවිතා කර නොතිබුණි. | පිළිගනිමි. 2022 වර්ෂයේ සිට එක් ක්ෂය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට කටයුතු කරනු ඇත. | නිශ්චිත නිවැරදි ක්ෂය ප්‍රතිපත්ති අනුව වත්කම් ක්ෂය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළ සඳහන් අංක 3.2.7 ගිණුම් ප්‍රතිපත්තිය අනුව තේ හා රබර් වෙනුවෙන් දරන ලද ප්‍රාග්ධන වියදම් පරිනත නොවූ වගාවේ සිට පරිනත වගාවට මාරු කරනු ලබන කාලය නිශ්චිතව දක්වා තිබුණද, මණ්ඩලයේ වතුයායන් තුළ පවතින අනෙකුත් ධාරක ජීව විද්‍යාත්මක වත්කම් එනම් කොකෝවා, අඹ, කුරුඳු, ඉඟුරු, සාදික්කා, පුවක්, කරදමුංගු, ගම්මිරිස් යන වගාවන්වල පරිනත වන කාලය මණ්ඩලයේ ගිණුම් ප්‍රතිපත්තිය තුළින් හෙළිදරව් කර නොතිබුණි . | අනෙකුත් ධාරක ජීව විද්‍යාත්මක වත්කම් සම්බන්ධව පිළිගත් ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුව ගිණුම් තුළින් අදාල කාල වකවානු 2022 වර්ෂයේ සිට හෙළිදරව් කිරීමට කටයුතු කරනු ඇත. | නිවැරදි ගිණුම්කරණ ප්‍රතිපත්ති සකස් කිරීම, හෙළිදරව් කිරීම හා ඒ අනුව ගිණුම් තැබීම සිදු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සතොස ආයතනයෙන් මණ්ඩලය වෙත ආපසු හරවා එවන ලද රු.2,177,332 ක් වටිනා තේ තොග අවසන් නිමි ද්‍රව්‍ය තුළ ඇතුළත් නොකොට, ඇසුරුම් ද්‍රව්‍ය තොගය තුළ ඇතුළත් කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසන් නිමි ද්‍රව්‍ය තොගය අවතක්සේරු වී තිබුණු අතර ඇසුරුම් ද්‍රව්‍ය තොගය අධිතක්සේරු වී තිබුණි. | 2019 වර්ෂයේ ගිණුම් සංශෝධනයේදී එම වටිනාකම අවසන් නිමි ද්‍රව්‍ය තොගයට ඇතුළත් කිරීමට කටයුතු කරනු ඇත. | තොග නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනය තුළ වත්කම් වර්ගීකරණයේදී කෙරීගෙන යන වැඩ යටතේ එයට අදාල නොවන රු.1,761,785ක් වටිනාකමැති කුඩා මාළු ව්‍යාපෘතිය, වතුර බෝතල් ව්‍යාපෘතිය, විශේෂ ව්‍යාපෘතිය හා විවිධ ව්‍යාපෘති යන අයිතම 04 ක් අන්තර්ගත කර තිබුණි. | ව්‍යාපෘති අසාර්ථක වී ඇත්නම් ලියා හැරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා පත්කර ඇති කමිටුවේ නිර්දේශය මත 2022 ගිණුම් සංශෝධනයේදි අධ්‍යක්ෂ මණ්ඩයේ අනුමැතිය මත ලියා හැරීමට කටයුතු කරනු ඇත. | වත්කම් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම් ගත කළ යුතුය. |
| (ඇ) | ජීව විද්‍යාත්මක වත්කම් යටතේ ගිණුම්ගත කළ යුතු රු.17,925,652ක් වටිනාකමැති පරිනත වගාවක් දේපළ, පිරියත හා උපකරණ යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2019 වර්ෂයේ ගිණුම් සංශෝධනයේදී නිවැරදි කරනු ඇත. | වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට පෙර 2002, 2003 හා 2012 වර්ෂවලදී පරිනත නොවූ වගාවේ සිට වැරදීමකින් පරිනත වූ වගාවට මාරු කරන ලද රු.2,305,369 ක් වූ රබර් වගාව සමාලෝචිත වර්ෂයේදී නැවත පරිනත නොවූ වගාව වෙත මාරු කර තිබුණි. මෙම වගාව වර්තමානය වන විට විනාශ වී හෝ වෙනත් හේතුවක් මත භෞතිකව නොපවතින බව තවදුරටත් නිරීක්ෂණය කෙරේ. | පරිනත නොවූ වගාවට මාරු කරන ලද රු. 2,305,369 ක් වූ රබර් වගාව වර්තමානය වන විට භෞතිකව නොපවතින බැවින් අදාල විස්තර අධ්‍යක්ෂක මණ්ඩලයට යොමුකර 2022 ගිණුම් වර්ෂ තුළදි ලියා හැරීමට කටයුතු කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් වූ වත්කම් භෞතිකව නොපැවතීමට හේතුන් හඳුනා ගැනීමට හා ගිණුම්වලින් ඉවත්කිරීමට නොපමාව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | මූල්‍ය ප්‍රකාශන අනුව කන්දල්ඔය වතුයායෙහි 1996 හා 1998 වර්ෂවලදී වගා කරන ලද රු.1,936,455ක එනසාල් වගාවක් පවතින නමුත්, භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූයේ මෙම වගාව වර්තමානය වන විට භෞතිකව නොමැති බවයි. එම වගාව පැවති භූමිය වර්තමානය වන විට වගා නොකළ භූමියක්ව පවතින බව තවදුරටත් නිරීක්ෂණය විය. | එනසාල් වගාව සම්බන්ධයෙන් කටයුතු සිදුකර 2022 වර්ෂයේදී ගිණුම් සංශෝධනයේදී ලියා හැරීමට කටයුතු කරනු ඇත. | මෙම ව්‍යාපෘතිය ආසාර්ථක වීමට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගැනීම, හානි පූර්ණය කර ගැනීම හා භෞතිකව නොපවතින වත්කම් හඳුනාගෙන ගිණුම්වලින් ඉවත් කිරීම කඩිනම් කළ යුතුය. |
| (ඊ) | මණ්ඩලය විසින් සෑම වර්ෂයකම අලෙවි කරනු ලබන වාණිජ වටිනාකමකින් යුතු ගස්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ ජීව විද්‍යාත්මක වත්කම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී රු.7,399,067 ක වටිනාකමකින් යුත් ගස් කපා ඉවත් කර තිබුණද, ගිණුම්වලින් ඉවත් කිරීමට පියවර ගෙන නොතිබුණි. | දැනට ආයතනය සතු සියළුම වාණිජ වටිනාකමකින් යුතු ගස් වල වටිනාකම මූල්‍ය ගිණුම් තුළ ජීව විද්‍යාත්මක වත්කම් ලෙස ගිණුම් ගත කොට නැත. අවශ්‍ය ගැලපීම් 2022 ගිණුම් වර්ෂය තුළින් සිදුකිරීමට කටයුතු කරනු ඇත. | මණ්ඩලය සතු ජීව විද්‍යාත්මක වත්කම් නිවැරදිව ගිණුම් තැබීමට හා අලෙවිකරන ලද ගස්වල පිරිවැය එම වත්කම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | 1996 වර්ෂයේ සිට ජංගම නොවන වත්කම් යටතේ ඇති කෙරීගෙන යන වැඩ යටතේ පැවත එන රු.3,197,505 ක් වූ වතුයායන් 5 ක ශේෂයන් සමාලෝචිත වර්ෂයේදී ගැලපීම් ගිණුමකට හර කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කල්බදු වත්කම් හා කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. මෙම ශේෂයන් පිළිබඳ පරීක්ෂාවන් කර ප්‍රාග්ධනිත කිරීමට, වැඩ අවසන් කිරීමට හෝ ලියා හැරීමට පියවර ගෙන නොතිබුණි. | 2022 ගිණුම් සංශෝධනයේදී අධ්‍යක්ෂ මණ්ඩයේ අනුමැතිය මත ලියා හැරීමට කටයුතු කරනු ඇත. | වතුයායන්වල කෙරීගෙන යන වැඩ ශේෂයන් පිළිබඳ පරීක්ෂාවන් කර එම වැඩ අවසන් කිරීමට හෝ ප්‍රාග්ධනිත කිරීමට විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කර ගිණුම්වලින් ලියා හැරීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ඌ) | මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දේපළ, පිරියත හා උපකරණ අත්පත් කරගැනීම සඳහා දරන ලද වියදම ලෙස රු.5,189,961 ක් හඳුනාගෙන තිබුණු නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දේපළ, පිරියත හා උපකරණ අත්පත් කරගැනීම සඳහා කිසිදු වියදමක් ගැලපීම් කර නොතිබුණි. | එකඟ වෙමි. | සමාලෝචිත වර්ෂයේදී මුදලින් ගෙවීම් කර අත්පත් කර ගත් ජංගම නොවන වත්කම්වල වටිනාකම ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ප්‍රවාහයට ගැලපිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ ජීව විද්‍යාත්මත වත්කම් එකතු කිරීම් රු.32,062,532 ක් සහ අස්පෘශ්‍ය වත්කම් ඉවත් කිරීම් රු.2,330,368 ක් වූ නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙම මුදල් ගලා යාම් සහ ගලා ඒම් දක්වා නොතිබුණි. | එකඟ වෙමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් ගලායාම් සහ ඒම් නිවැරදිව දැක්විය යුතුය. |
| (ඒ) | හලාවත වැවිලි සමාගමට සහ රාජ්‍ය කළමනාකරණ මණ්ඩලය (SRMC) යන ආයතනයන්ට සමාලෝචිත වර්ෂයේ සිදුකළ පොලී ගැලපීම් වන රු.3,579,800 ක් මණ්ඩලය විසින් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ ණය මුදල් ලබා ගැනීම් (මුදල් ගලා ඒම්) ලෙස හදුනා ගෙන තිබීම හේතුවෙන් රු.3,579,800කින් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ වන ශුද්ධ මුදල් ප්‍රවාහය වැඩි වී තිබුණි. | එකඟ වෙමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් නිවැරදිව ගැලපීම් කළ යුතුය. |
| (ඔ) | සමාලෝචිත වර්ෂය තුළ පොත්වලින් ඉවත් කරන ලද භෞතිකව නොපැවති රු.4,841,741 ක පරිනත නොවූ රබර් වගාවන්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අලාභයට එකතු කිරීම හේතුවෙන් එම වටිනාකමින් මෙහෙයුම් තුළින් උත්පාදනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය වැඩි වි තිබුණි. | එකඟ වෙමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් නිවැරදිව ගැලපිය යුතුය. |
| (ඕ) | මණ්ඩලය විසින් සකස් කරනු ලබන ජර්නල් වවුචර සකස් කිරීමේ නිලධාරියා පමණක් අත්සන් තබා ඇති නමුත් ජර්නල් වවුචර පරීක්ෂා කරන නිලධාරියා හා අනුමත කරන නිලධාරියා අත්සන් තබා නොතිබුණි. | අදාල ජ'නල් වවුචර්පත් අනුමත කිරීමට කටයුතු කරනු ඇත. | ජර්නල් වවුචර සකස් කරන, පරීක්ෂා කරන හා අනුමත කරන නිලධාරින් එහි අත්සන් තැබිය යුතුය. |
| (ක) | පරිනත නොවූ තේ වගාව පරිනත වීම සඳහා වර්ෂ 4 ක් ගතවන බව ගිණුම් මඟින් හෙළිදරව් කර තිබුණද, 2007 සිට 2013 වර්ෂය දක්වා වගාකරන ලද වර්ෂ 5 සිට වර්ෂ 11ක් දක්වා වූ රු.29,011,699 ක තේ වගාව පරිනත තේ වගාව වෙත මාරු කර තිබුණේ සමාලෝචිත වර්ෂයේදීය. | ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව 2017 වර්ෂයේදි ලද විගණන විමසුමට අනුව ජීව විද්‍යාත්මක වත්කම් වල ක්ෂය කිරීම් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණු ප්‍රතිපත්ති ප්‍රකාරව පරිණත වගාවන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ග) | 1992 වර්ෂයේදී ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් ප්‍රාදේශීය වතු සමාගම් වෙත පවරන ලද ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශන තුළද ඇතුළත් කර නොතිබුණි. | 1992 වර්ෂයේදී ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් ප්‍රාදේශීය වතු සමාගම් වෙත පවරන ලද ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ තොරතුරු මුදල් අංශයේ නැත. එසේ හෙයින් මෙම වත්කම් මූල්‍ය ප්‍රකාශන තුළ දේපල පිරියත හා උපකරණ යටතේ සටහන් කර හෝ හෙළිදරව් කර නැත. | ප්‍රාදේශීය වතු සමාගම් වෙත පවරන ලද ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ විස්තර මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කළ යුතුය. |
| (ච) | මණ්ඩලය විසින් 2018 දෙසැම්බර් 31 දින වනවිට රු.37,796,794 ක ඉඩම් බදු කුලී ආදායමක් හා රු.36,553,920ක ගොඩනැගිලි බදු කුලී ආදායමක් උපයාගෙන ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන තුළ ඇති ආයෝජිත දේපළ යටතේ මෙම බදු දී ඇති ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම හෙළිදරව් කර නොතිබුණි. | පිළිගෙන ඇත. | මූල්‍ය ප්‍රකාශන තුළ ආයෝජිත දේපළ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ජ) | සමාලෝචිත වර්ෂය අවසානයට මණ්ඩලයේ පවතින ශුද්ධ වටිනාකම රු.458,732,760 ක් වූ තේ, පොල්, රබර් වැනි ධාරක ජීව විද්‍යාත්මක වත්කම් පිළිබඳව සංගණනයක් සිදු කර ඒවායේ පැවැත්ම තහවුරු කර ගෙන නොතිබුණි. | ධාරක ජීව විද්‍යාත්මක වත්කම් පිළිබඳව වාර්තාවන් දැනට ජනවසම විසින් පිළියෙල නොකරන අතර ඒ පිළිබඳව සංගණන වාර්තාවක් සියලුම වතු යායන් විසින් ලබා ගැනීමට කටයුතු කරමි. තවද 2022 ගිණුම් වර්ෂය වෙනුවෙන් එම වාර්තාව ලබා ගැනීම සඳහා ක්‍රියා කර ඇත. | සෑම වර්ෂයකදීම ජීව විද්‍යාත්මක වත්කම් පිළිබඳ සංගණනයක් කර ඒහි පැවැත්ම තහවුරු කර ගත යුතුය. |
| (ට) | මණ්ඩලය විසින් සේවක අර්ථසාධක අරමුදල (EPF) වෙත ගෙවිය යුතු මුදල් නිසි පරිදි නොගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට සේවක අර්ථසාධක අරමුදල වෙත රු.340,623,374ක දඩ මුදලක් ගෙවිය යුතුව ඇතත් මෙම වගකීම සම්බන්ධයෙන් කිසිදු වෙන් කිරීමක් මූල්‍ය ප්‍රකාශන තුළ සිදුකර නොතිබුණි. | 2001 වර්ෂයේ සිට ආයතනය මුහුණ පා සිටින මූල්‍ය අර්බුදය හේතු කොට ගෙන නියමිත දිනට ව්‍යවස්ථාපිත වගකීම් ගෙවීමට නොහැකි වීම මත සේවක අර්ථ සාධක අරමුදල් වෙනුවෙන් දඩ මුදලක්ද ගෙවිය යුතුව ඇති අතර එම වගකීම් නිසි පරිදි ප්‍රේෂණය කළේ නම් එම අනාර්ථික වියදම මගහරවා ගත හැකිව ඇත. | ව්‍යවස්ථාපිත වගකීම් නියමිත දිනට පියවීමට හා අධිභාර වලක්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඩ) | වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ තුළ වතුයායන් විසින් බාහිර පාර්ශවයන්ගෙන් විවිධ හේතූන් මත අය කරන ලද මේ දක්වා අවසන් ගිණුම් තුළ වසරේ ආදායමට හඳුනා නොගත් රු.866,884 ක මුදලක් පැවතුණි. | වර්ෂයේ ආදායමට හඳුනා නොගත් රු.866,884 ක මුදල් වර්ෂයේ ආදායම ලෙස 2019 වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදිව දැක්වීමට කටයුතු කරනු ඇත. | වර්ෂයේ ආදායම නිවැරදිව හඳුනා ගත යුතුය. |
| (ණ) | කන්දල්ඔය හා නාගස්තැන්න වතුයායන්හි මූල්‍ය ප්‍රකාශන තුළ 2011 සැප්තැම්බර් 09 දින රු.2,787,206 ක මුදල් නැති වීම සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනුකර ඇති බව දක්වා තිබුණත්, ඒ පිළිබඳව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළ කිසිදු හෙළිදරව් කිරීමක් හෝ වෙන් කිරීමක් සිදු කර නොතිබුණු අතර මෙම මුදල් නැවත අයකර ගැනීමට නොහැකිවී තිබුණි. | මුදල් නැතිවීම සම්බන්ධයෙන් දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග හා මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනුකර ඇති නඩුව සම්බන්ධයෙන් ප්‍රගතිය බලා මෙම අලාභයේ සම්පූර්ණ ප්‍රමාණය ගිණුම් තුළින් ලියා හැරීමට අවශ්‍ය තොරතුරු ප්‍රධාන කාර්යාලයට යොමු කරන ලෙස එම වතුයායන්හි අධිකාරීවරුන්ට දන්වා ඇත. | මූල්‍ය අලාභ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ අවශ්‍ය වෙන් කිරීම් හා හෙළිදරව් කිරීම් සිදු කළ යුතුය. |
| (ත) | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය (PMMD) විසින් ක්‍රියාත්මක කර තිබූ වතු සංවර්ධන ව්‍යාපෘතිය 2010 වර්ෂයේදී අවසන් වී තිබුණු නමුත් එහෙත් එම ව්‍යාපෘතියට අදාලව 2018 දෙසැම්බර් 31 දිනට රු.4,136,733ක් එම අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය නොවූ ණයගැති ශේෂයක් ලෙස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. | මෙම ව්‍යාපෘතිය 2010 පමණ අවසන් කරන ලදී. එම අවස්ථාව වන විට ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත ප්‍රතිපූර්ණය නොවූ මුදල රු.4,136,733කි. මෙම ව්‍යාපෘතිය සහ ආයතනය දැනට ක්‍රියාත්මක නොවන බැවින් අවශ්‍ය ගිණුම් සංශෝධනයන් 2020 වර්ෂයේදී සිදුකර ලියා හැරීමට කටයුතු කරනු ඇත. | ක්‍රියාත්මක නොවන දිගුකාලීන ව්‍යාපෘතිවලින් ප්‍රතිපූර්ණය නොවූ ණය ගැති ශේෂ සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ෂවයන්ට විරුද්ධව නොපමාව කටයුතු කළ යුතු අතර නිසි අනුමැතීන් මත මෙම ශේෂ ගිණුම්වලින් ගැලපීමට ද අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ද) | 2001 වර්ෂයේදී බදු පදනම මත පුද්ගලික අංශයට පවරන ලද මොන්ත ක්‍රිස්ටෝ වතුයායේ ශුද්ධ වත්කම් වටිනාකම වූ රු.40,503,226 ක් වර්ෂ 17 ක කාලයක සිට ණයගැතියන් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණු නමුත් මෙම ශේෂය පිළිබඳ නිශ්චිත පැහැදිලි කිරීමක් නොතිබුණු අතර, මෙය අයකර ගත නොහැකි බව නිරීක්ෂණය වුවද මූල්‍ය ප්‍රකාශන තුළ අඩමාණ ණය වෙන් කිරීමක් සිදු කර නොතිබුණි. | 2001 වර්ෂයේදී පමණ මෙම වතුයාය බදු පදනම මත පුද්ගලික අංශයට පැවරීමෙන් පසු එම වතුයාය වෙනුවෙන් ශුද්ධ වත්කම්වල අගය වූ රු.40,503,226ක අගයක් ප්‍රධාන කාර්යාලයේ ගිණුම් පොත්පත් වල පෙන්නුම් කරනු ලබයි. මෙම ශේෂය 2001 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා අඛණ්ඩව ආයතනයේ ගිණුම් පොත්පත් වල පෙන්නුම් කර ඇත. | අයවිය යුතු ශේෂ පිළිබඳ නිශ්චිත පැහැදිලි කිරීම් විගණනයට ලබා දිය යුතු අතර ශේෂ සනාථන මඟින් එම ශේෂ තහවුරු කර ගත යුතුය. එසේම මෙම ශේෂ සම්බන්ධයෙන් අවශ්‍ය ගැලපීම්ද මූල්‍ය ප්‍රකාශන තුළ සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (න) | සලකා බලන මූල්‍ය වර්ෂයේ ගොඩනැගිලි කුලී ආදායම රු.36,553,920ක් වූ නමුත් ජාතිය ගොඩනැගීමේ බදු වාර්තා අනුව එය රු. 18,496,844 ක් වූ බැවින් ජාතිය ගොඩනැගීමේ බදු ගණනය කිරීමේදී එම පනතේ 3 (2) (iii) අනුකූල නොවන පරිදි ජාතිය ගොඩනැගීමේ බදු රු.361,141 (18,057,076*2%) කින් අවතක්සේරු වී තිබුණි. | ඉඩම් ,ගොඩනැගිලි බදු කුලී ගිවිසුම් වල පවතින වැරදි අඩුපාඩු හේතුවෙන් ලැබිය යුතු බදු කුලී ආදායම් ලෙස ගිණුම් ගත කළ ද එම බදු මුදල් නියමිත වේලාවට, නියමිත මුදල නොලැබෙන බැවින් මුදල් පදනමට වාර්තා සකස්කර ඇත.හේතුව නොලැබෙන ආදායම් සම්බන්ධයෙන් බදු මුදල් ගෙවීමට ප්‍රමාණවත් කාරක ප්‍රාග්ධනයක් ආයතනයේ නොමැති වීමය. | ජාතිය ගොඩනැගීමේ බදු පනතේ විධිවිධාන අනුව එම බදු ගණනය කළ යුතුය. |

**1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | | |
| (අ) | පාරිතෝෂික වෙන්කිරීම් ගිණුමේ ශේෂය | 504,888,251 | 504,793,974 | 94,277 | පාරිතෝෂික දිමනා ගනණය කිරිම සම්බන්ධයෙන් නිවැරදි වාර්තාවක් ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත විගණන ආයතනයකට භාර දී ලබා ගන්නා ලද නිවැරදි ගණනය කිරීම්වලින් පසු වතුයායන් තුනෙහි පෙන්වාදී ඇති වෙනස්වීම් 2019 වර්ෂයේදී නිවැරදි කර ඇත. | නිවැරදි වටිනාකම ඇතුළත් කර අනුරූපී වාර්තා පවත්වා ගත යුතුය. |
| (ආ) | පාරිතෝෂික ගිණුමේ ශේෂය | 463,392,621 | 467,753,167 | 4,360,546 | පෙන්වා දී ඇති වෙනස්වීම් 2019 වර්ෂයේදී නිවැරදි කර ඇත. | නිවැරදි වටිනාකම ඇතුළත් කර අනුරූපී වාර්තා පවත්වා ගත යුතුය. |
| (ඇ) | පාරිතෝෂික සම්බන්ධ අධිභාර වෙන්කිරීම් ගිණුමේ ශේෂය | 143,202,687 | 144,920,316 | 1,717,629 | මණ්ඩලයේ 2018 වර්ෂයේ පාරිතෝෂික අධිභාර වෙන් කිරීමේ ගිණුමේ ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව මෙම වතුයායන් වල එනම් හන්තාන, ලෙවලන්, | නිවැරදි වටිනාකම ඇතුළත් කර අනුරූපී වාර්තා පවත්වා ගත යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | රුක්වුඩ්, ලූල්කඳුර, නාගස්තැන්න හා කන්දල්ඔය යන වතුයායන්හි උප ලේඛන අතර ශේෂයන් සැසඳිමේ දි වෙනසක් ඇති බව විගණන විමසුම අනුව නිරීක්ෂණයවී ඇත. | |
| (ඈ) | සතොස ආයතනයෙන් මණ්ඩලය වෙත ආපසු හරවා එවන ලද තේවල වටිනාකම | 3,482,941 | 3,450 | 3,479,491 | සතොස ආයතනය විසින් ජනවසම වෙත මුදල් ගෙවීමේදි නිකුත් කරනු ලබන සැසඳුම් වාර්තා අනුව ජනවසමට ආපසු හරවා එවන ලද තේ තොග ලැබී නොමැත. එහෙයින් 2011 පෙබරවාරි 23 වන දිනට ගබඩාවේ ඇති තේ තොග ලේඛන අනුව ශේෂය අඩුවෙන් පෙන්නුම් කර ඇත. | නිවැරදි වටිනාකම ඇතුළත් කර අනුරූපී වාර්තා පවත්වා ගත යුතුය |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙතින් ලැබිය යුතු ණය හා පොලී ශේෂය | 119,346,347 | 97,709,342 | 21,637,005 | මෙම ශේෂ වැවිලි සංස්ථාව සමඟ සාකච්ඡා කර 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | නිවැරදි වටිනාකම ඇතුළත් කර අනුරූපී වාර්තා පවත්වා ගත යුතුය. |
| (ඊ) | ප්‍රධාන කාර්යාලයේ කල්බදු අවිනිශ්චිත පොලි වටිනාකම | 585,032 | 532,168 | 52,864 | 2019 ගිණුම් සංශෝධනයේදි නිවැරදි කිරිමට කටයුතු කරනු ඇත. | නිවැරදි වටිනාකම ඇතුළත් කර අනුරූපී වාර්තා පවත්වා ගත යුතුය. |
| (උ) | කල්බදු වගකීම | 852,991 | 1,064,000 | 211,009 | 2019 ගිණුම් සංශෝධනයේදි නිවැරදි කිරිමට කටයුතු කරනු ඇත. | නිවැරදි වටිනාකම ඇතුළත් කර අනුරූපී වාර්තා පවත්වා ගත යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ඍ) | ජන තේ අංශයෙහි වෙළඳ ලැබිය යුතු ශේෂය | 28,995,786 | 29,390,337 | 394,551 | ජනතේ අංශයෙහි වෙළඳ ලැබිය යුතු ශේෂය 2019 වර්ෂයේ ගිණුම් සංශෝධනයේදී නිවැරදි කරනු ඇත. | නිවැරදි වටිනාකම ඇතුළත් කර අනුරූපී වාර්තා පවත්වා ගත යුතුය. |
| (එ) | ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු | 8,369,467 | 1,182,458 | 7,187,009 | ආර්ථික සේවා ගාස්තු උපචිත පදනමටත් ආදායම් බදු මුදල් පදනම මත සිදුකිරීම හේතුවෙන් මෙම වෙනස සිදු වී ඇත. | නිවැරදි වටිනාකම ඇතුළත් කර අනුරූපී වාර්තා පවත්වා ගත යුතුය. |

**1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | වතුයායන්ගේ පාරිතෝෂික ගෙවීම් | 616,860,963 | පාරිතෝෂික ගෙවීම් උපලේඛනය | මෙම විමසුමට අදාල පිළිතුරු 2021.04.08 දිනැති ලිපියට අනුව ජේර්ඩීබී/2022/තොරතුරු /14 දරන විගණන විමසුමට පිළිතුරු යටතේ ලබාදී ඇත. | පාරිතෝෂික ගෙවීම් උපලේඛනය විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | අවසන් තොග අගය කිරීම හා ශේෂ සනාථන | 109,527,017 | භෞතික තොග සත්‍යාපන වාර්තා හා ශේෂ සනාථන | ශේෂ පත්‍ර දිනට තොග අගය කිරීමේදී පිරිවැය මත අගය කිරීමක් සිදුකර ඇත. එම අගය කිරීම සනාථ කිරීම සඳහා පාරිභෝගික අංශයට අදාල තොග සත්‍යාපන ලේඛන 2022 මාර්තු 26 වන දින විගණන අංශයට ඉදිරිපත් කර ඇත. | අවසන් තොගයට අදාළ විස්තරාත්මක තොග සත්‍යාපන වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතු අතර අවසන් තොගයේ වටිනාකම නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලට ගත යුතුය. |
| (ඇ) | ආපසු හරවා එවන ලද තේ | 2,177,332 | භෞතික සත්‍යාපන තොග වාර්තා | ගිණුම් සටහන් පිළියෙල කිරීම සඳහා ආපසු එවන ලද තොගයන් වෙනම ගිණුමක ගිණුම් ගත කිරීම නිසා මෙම ලෙජර් ගිණුම් ශේෂය ඇතිවී ඇත. ඒ සඳහා භෞතික තොග සත්‍යාපන වාර්තා ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. | ශේෂ පත්‍ර දිනට පැවති ආපසු එවූ තොගය, භෞතිකව සත්‍යාපනය කර වාර්තා විගණනයට ලබා දිය යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | ණයහිමි ශේෂය | 440,754,273 | ශේෂ සනාථන ලිපි සහ පසුකාලින නිරවුල් කිරීම් පිළිබඳ තොරතුරු | සී.අයි.සී ඇග්රෝ සමාගමෙන් අදාල වර්ෂය සඳහා ශේෂ සනාථන ලිපි ලැබී නැති අතර රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පැවති සංස්ථා, මණ්ඩල, සහ සමාගම් මේ වන විට වසා දමා ඇත.ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ලංකා මිනරල් සැන්ඩ්, ලංකා පිහන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය,මහජන බැංකුව,පැන් ඒෂියා බැංකුව යන ආයතනවලින් ශේෂ සනාථ ලබාදෙන ලෙස ඉල්ලීම කළද මේ දක්වා ශේෂ සනාථ ලබාදී නොමැත. | ණයහිමි ශේෂ සනාථන ලිපි විගණනයට ඉදිරිපත් කළ යුතු අතර ණය හිමි ශේෂ නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | අක්‍රිය තත්ත්වයේ පවතින ඕනුගල්ඔය වතුයායෙහි ස්ථාවර වත්කම් | 6,013,927 | ස්ථාවර වත්කම් උපලේඛන | මෙම ශේෂයන් පොත්වලින් ඉවත් කිරිමට පාලන අධිකාරියේ අවසරය මත 2022 වර්ෂයේදී කටයුතු කරනු ඇත. | මණ්ඩලය සතු වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කළ යුතු අතර භෞතිකව නොමැති වත්කම් ශේෂයන් විධිමත් පරීක්ෂාවකින් පසුව පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ස්ථාවර වත්කම් මිලදී ගැනීම් | 5,189,962 | ස්ථාවර වත්කම් මිලදී ගැනීමට අදාළ වවුචර් හා බිල්පත් | ස්ථාවර වත්කම් වල වර්ෂය තුලදී මිලදී ගැනීම් සනාථ කිරිම සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් විගණනය සඳහා ඉදිරිපත් කර ඇත. | මිලදී ගන්නා ලද ස්ථාවර වත්කම් සනාථ කර ගැනීම සඳහා අවශ්‍ය මූලික ලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (උ) | ධාරක හා පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම්ලට අදාල වර්ෂයේ එකතු කිරීම් | 30,095,968 | ගෙවීම් වවුචර්,ජනල් වවුචර්, බිල්පත් | සමාලොචිත වර්ෂයේදි එකතු කරන ලද ධාරක හා පාරිභොජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් සනාථ කර ගැනිම සඳහා අවශ්‍ය ලේඛන විගණනයට ඉදිරිපත් කර ඇත. | ධාරක හා පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් සනාථ කර ගැනීම සඳහා අවශ්‍ය වවුචර,ජනල් හා බිල්පත් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඍ) | කල්බදු ගිවිසුම් | 38,553,244 | දේපළ පිළිබඳ විස්තර ඇතුළත් කල්බදු ගිවිසුම් | මොන්තක්‍රිස්ටෝ වතුයාය 2003 දී පමණ පුද්ගලික අංශයට බදු දෙන අවස්ථාවේදි ගිණුම් පොත්පත් වල තිබු වත්කම් ප්‍රධාන කාර්යාලයට මාරුකරන ලද අතර බැරකම් එම මණ්ඩලයට පවරන ලදී . පසුව 2017 ජුනි මස පමණ මෙම වතුයාය නාවලපිටිය ප්ලාන්ටේෂන් පුද්ගලික මණ්ඩලය නමින් හැඳින්වෙන මණ්ඩලයකට පවරන ලද අතර, එම වතුයායට අයත් වත්කම් හා දේපළ ප්‍රධාන කාර්යාලයේ පොත්පත් වල එලෙසින්ම පවති. මේ පිළිබඳව 2019 ගිණුම් තුළින් එකි වත්කම් පිළිබඳව හෙළිදරව් කිරිමට කටයුතු කරනු ඇත. | කල්බදු ගිවිසුම් විගණනයට ඉදිරිපත් කළ යුතු අතර, කල්බදු වත්කම් නිවැරදිව ගිණුම් තැබීම හා අවශ්‍ය හෙලිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන තුළ සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (එ) | කල්බදු ණය හිමි ශේෂය | 4,087,333 | ණය හිමි ශේෂ සනාථන හා වයස් විශ්ලේෂණ | වතුයායන්ගේ ගෙවිය යුතු බදු කුලී ණය හිමි ශේෂයේ වටිනාකම 2018.12.31. දින වන විට රු. 4,087,333 ක මුදලක් පෙන්නුම් කර ඇත්තේ ගිණුම් තැබීමේ දෝෂයක් නිසා වන බැවින් එම ශේෂය 2020 ගිණුම් වර්ෂයේදි නිවැරදි කර ඇත. | ශේෂ සනාථන විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) | පෞද්ගලික පරිගණක මෘදුකාංග සැපයුම් සමාගමට ගෙවිය යුතු ශේෂය | 852,991 | ගෙවිය යුතු ශේෂ සනාථන හා වයස් විශ්ලේෂණ | පෞද්ගලික සමාගමක් වෙත ගෙවිය යුතු කල්බදු වටිනාකම වු රු.852,991 ක ශේෂ සඳහා ශේෂ සනාථන ලිපි ලැබී නොමැත. | ගෙවිය යුතු ශේෂ සම්බන්ධයෙන් ශේෂ සනාථන හා වයස් විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඔ) | කල්බදු අවිනිශ්චිත පොලී | 1,361,403 | කල්බදු අවිනිශ්චිත පොලී පිළිබඳ සනාථන වයස් විශ්ලේෂණ | රු. 776,371ක ශේෂය 2007 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එන ශේෂයක් බැවින් තොරතුරු සොයා ගැනීම අපහසු වී ඇත. මෙම වැරදි ගිණුම් ගත වීම 2020 වර්ෂයේ නිවැරදි කර ඇත. | ආරම්භක ශේෂයන්ට අදාළ තොරතුරු ලබාගෙන වැරදි ගිණුම් ගත වීම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඕ) | මූල්‍ය කල්බදු වට්නාකම | 136,160 | මූල්‍ය කල්බදු ගිවිසුම | මෙම කල්බදු වට්නාකමින් පිළිබිඹු වන්නේ පෞද්ගලික හිනැන්ස් ආයතනයකට ගෙවිය යුතු ශේෂයක් බවය. මෙහි නිවැරදිතාවය පරීක්ෂාකර බලා 2022 ගිණුම් සංශෝධනයේදි නිවැරදි කරමි. | ගෙවිය යුතු මෙම කල්බදු ශේෂවල නිවැරදිතාවය පිළිබඳව පරීක්ෂාකර අවශ්‍ය නිවැරදි කිරීම් නොපමාව සිදු කළ යුතුය. |
| (ක) | කල්බදු අත්තිකාරම් | 50,353,716 | ශේෂ සනාථන සහ කාල විශ්ලේෂණ | ආයතන 2ක් විසින් 2018.12.31 දිනට එවා ඇති ශේෂ සානාථන වාර්තා මේ සමඟ ඉදිරිපත් කරමි. අනිත් ආයතන මගින් ශේෂ සනාථන ලිපි ලැබී නොමැත. | කල්බදු අත්තිකාරම් ශේෂය සනාථ කර ගැනීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ග) | හඳුනා නොගත් තැන්පතු වට්නාකම | 6,461,737 | තැන්පතු ශේෂ සනාථන | සෘජුවම බැංකු වෙත තැන්පත් කර ඇති ක්ෂණිකව හඳුනාගත නොහැකි ලැබීම් මෙම ලෙජර් ගිණුම් වෙත ගිණුම් ගත කර අදාල ලැබීම් හඳුනාගත් පසු නිවැරදි ගිණුම් වෙත ගිණුම් ගත කරනු ඇත. | සෘජු තැන්පතු නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ච) | තැන්පතු /බදු දේපළ සඳහා අත්තිකාරම් | 93,024,351 | ශේෂ සනාථන හා වයස් විශ්ලේෂණ | බදු දේපළ සඳහා ඇති ලෙජර් ශේෂ වල නිවැරදි තාවය පිළිබඳ ගැටළුකාරී තත්ත්වයක් උද්ගත වී ඇත. | බදු දේපල ලෙජර් ශේෂයන්හි නිවැරදිතාවය පිළිබඳ තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ජ) | කොත්මලේ ජලාශ ව්‍යාපෘතිය | 40,548,258 | ණය සඳහා ලිඛිත සනාථන | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. | ණය ශේෂය සඳහා ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වෙනුවෙන් මහවැලි අමාත්‍යාංශයෙන් ලබා දී තිබූ ණය | | | | කළ යුතුය. |
| (ට) | විවිධ , ජනතේ, වෙළෙඳ හා ප්‍රධාන කාර්යාලයේ ණයගැති ශේෂ, ප්‍රධාන කාර්යාලය සමඟ වතුයායන් හා ජනතේ අංශය පවත්වාගෙන යනු ලබන පාලන ගිණුම්වල ශේෂ | 671,352,252 | ශේෂ සනාථන හා වයස් විශ්ලේෂණ | මෙම ණය ගැතියන් සම්බන්ධව අයකර ගැනීම් සඳහා දැනට ක්‍රමවත් වැඩපිළිවෙලක් ගෙන නැත. ජනතේ අංශයේ පැරණි ණය ගැති ශේෂයන් 2004 වර්ෂයේ සිට පැවත එයි. අවශ්‍ය පසු විපරම් සිදුකරනු ඇත. | ණයගැති ශේෂ සනාථන හා වයස් විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් කළ යුතු අතර, ණය ගැතියන් අය කර ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඩ) | රඳවා ගැනීමේ බදු | 9,670,772 | අදාල රඳවා ගැනීමේ බදු සහතිකපත්‍ර | දැනට මුදල් අංශයේ ඇති බදු රඳවා ගැනීමේ සහතික පත්‍ර කීපයක් මේ සමඟ ඉදිරිපත් කර ඇත. | ගිණුමේ සඳහන් වටිනාකමට අදාළ රඳවා ගැනීමේ බදු සහතික පත්‍ර විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | බාහිර පාර්ශවයන්ට තේ දළු අලෙවි කිරිම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 වන විට රු.33,196,752 ක ණය ගැති ශේෂයක් පවතී. තේ දළු අළෙවි කිරීමේදී දින 14ක පමණ ණය කාලයක් ලබා දෙන නමුත්, උක්ත රු.28,183,139ක ණයගැති ශේෂය, 2003 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා පැරණි වන නමුත්, මෙම පැරණි ශේෂ අයකර ගැනීමට මණ්ඩලයට නොහැකිවී තිබුණි. | පිළිගනිමි. විවිධ ආයතන වෙත තේ දළු ණය පදනම මත අලෙවි කිරීම නිසා 2018 දෙසැම්බර් අවසානය වන විට ලැබිය යුතු අරමුදල් මෙහි පවතින අතර නඩු කටයුතු, හා වෙනත් කරුණු මත ඒවා නැවත අයකර ගැනීමට නොහැකිවී ඇති අතර ඉදිරියේදි අයකර ගැනීමට කටයුතු කරනු ඇත. | පැරණි ශේෂ අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1999 සිට 2016 දක්වා වර්ෂ වලට අදාල රු.4,008,885ක පැරණි ණයගැති ශේෂ 33 ක් වතුයායන්හි පවතින | මෙම ගිණුම් මඟින් පිළිඹිබුවන ශේෂයන් අතරින් හුදෙක් වියදම් ප්‍රාග්ධන ස්වරූපයක් ගන්නා ලදි. | ණයගැති ශේෂ අය කර ගැනීමට හා පැරණි ණයගැතියන් |

| | | | |
|---|---|---|---|
| | නමුත්, එම ශේෂ අය කර ගැනීමට හෝ මූල්‍ය ප්‍රකාශන තුළ අඩමාණ ණය වෙන්කිරීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි. | එම වියදම් වල නිවැරදිතාවය වතුයායන් තුළින් සහතික කරවා 2020 ගිණුම් වර්ෂයේදි ප්‍රාග්ධනිත කිරීම හෝ අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය පරිදි ලියාහැරීමට කටයුතු කරනු ඇත. | සඳහා අදාළ වෙන් කිරීම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ජන තේ අංශයේ සමස්ත ණයගැති ශේෂය රු 29,390,337ක් වූ අතර, ණයගැති වයස් විශ්ලේෂණය අනුව දින 90 ට වැඩි ණයගැති ශේෂය රු. 21,748,690ක් විය. එම ශේෂය අතරින් වර්ෂයට වැඩි සමස්ත ණයගැතියන් රු.11,625,553 ක් වන අතර, එම ශේෂයන් වර්ෂ ගණනාවක් පැරණි වන නමුත් මෙම ශේෂ අය කර ගැනීම හෝ අඩමාණ ණය වෙන් කිරිමක්ද සිදු කර නොතිබුණි. | මෙම ණය ගැති ශේෂයන් අය කර ගැනීමට අපේක්ෂිතව කටයුතු කර ඇති බැවින් බොල් ණය වෙන් කිරීමක් සිදුකර නොමැත. අය කර ගැනීමට ගෙන ඇති පියවර සම්බන්ධයෙන් ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර ඇත. | ණයගැති ශේෂ අය කර ගැනීමට හා පැරණි ණයගැතියන් සඳහා අදාළ වෙන් කිරීම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2018 දෙසැම්බර් 31දිනට පැවති ශේෂ අතරින් තෝරා ගත් ණයගැති ශේෂ රු.288,839,894 ක් සඳහා 2022 මාර්තු 15 දින වන විට ණයගැතියන් විසින් පියවා තිබුණේ රු.8,856,575ක් පමණක් වූ අතර, එම පියවීම් කර තිබුණේ 2019 වර්ෂයේදීය. ඒ අනුව උක්ත ශේෂ අතරින් රු.279,983,319ක් අයකර ගැනීමේ හැකියාවක් නොපවතින බව නිරීක්ෂණය විය. | 2018 දෙසැම්බර් 31 දිනට පවතින ණය ගැති ශේෂයන් ගෙන් ඉඩම් අංශයට අදාල ලැබිය යුතු බදු කුලී හා කාර්යාල කුලී මෙම ශේෂයන් මගින් පෙන්නුම් කරනු ලැබේ. අදාල සංශෝධනයන් 2021 හා 2022 යන ගිණුම් වර්ෂයන් තුළින් සිදුකර ඉදිරිපත් කරනු ඇත. | ණය ගැතියන්ගෙන් මුදල් අය කර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතු අතර, ගිණුම් තුළ පවතින අයකරගත නොහැකි ශේෂ සම්බන්ධයෙන් අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂවලදී අයකරගත නොහැකි බවට හඳුනාගත් රු. 11,190,988ක් වටිනා ණයගැති ශේෂ ගැලපීම් (Adjustment) ලෙස මූල්‍ය ප්‍රකාශ තුළ ඇතුළත් කර තිබීම හේතුවෙන් උක්ත වටිනාකමින් ජංගම වත්කම් අධිතක්සේරු වී ඇති බව නිරීක්ෂණය විය. | මෙම ගිණුමෙන් දක්වා ඇත්තේ ලියා හැරීමට කටයුතු කළ වතුයායන් වල තිබූ අයකර ගත නොහැකි ණය ගැති හා ණය හිමි ශේෂයන්ගේ ශුද්ධ වටිනාකම වේ. අවශ්‍ය තහවුරු කිරීම් සිදුකර හා අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ඇතුව 2022 වර්ෂයේදී ලියා හැරිමට කටයුතු කරනු ඇත. | විධිමත් හා ප්‍රමාණාත්මක තහවුරුවක් මත හා අවශ්‍ය අනුමැතීන් තුළින් පමණක් ණයගැතියන් ලියා හැරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වසරේ අවසාන දිනය වන විට වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ තුළ වතුයායන් අතර සිදුවන ගනුදෙනු නිසි පරිදි නිරවුල් කර නොගැනීම හේතුවෙන් නිරවුල් නොවූ රු. 36,833,017ක බැර ශේෂ 7ක් නිරීක්ෂණය වන අතර, අදාල වටිනාකම් 2018 වසරේ අවසන් ගිණුම් | පිළිගනිමි. අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය මත ලියා හැරිමට හෝ තොරතුරු සොයා නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. | වතුයායන් අතර පවතින ශේෂ නොපමාව නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පිළියෙළ කරන අවස්ථාව වන විටත් නිරවුල් කර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | මණ්ඩලයේ ණයහිමි කාල විශ්ලේෂණය අනුව වසර 1 සිට වසර 5 දක්වා නිරවුල් නොකළ ශේෂය රු.15,663,093ක් හා වසර 5 ඉක්මවා ඇති මේ දක්වා නිරවුල් නොකළ ශේෂය රු. 103,092,804ක් වූ අතර, එම ශේෂයන් නිරවුල් කිරීමට හෝ පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ආයතනයේ පැවති හා දැනට පවතින මූල්‍ය දුෂ්කරතාවය හේතුකොටගෙන මෙම ණය හිමියන් නිරවුල් කිරිමට නොහැකි වී ඇත.කෙසේ වෙතත් මූල්‍ය තත්වය යහපත් වූ විට අවශ්‍ය ගෙවීම් කටයුතු සිදුකරනු ඇත. | ණය ශේෂ නිරවුල් කිරීමට කඩිනම් වැඩපිළිවෙලක් නොපමාව ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | මණ්ඩලයේ වතුයායන් 18 ක රු. 32,545,313ක් වටිනා උත්සව අත්තිකාරම් ශේෂයක් පවතින අතර ඒවා 2000 වර්ෂයේ සිට පැවත එන මෙම පැරණි ශේෂ අතුරින් රු.252,185 ක උත්සව අත්තිකාරම් සකස් වී ඇති ආකාරය පිළිබඳ තොරතුරු මණ්ඩලය සතුව නොතිබුණි. | මෙම කාල සීමාව තුල සේවකයින් මිය යාම ,සේවයෙන් පහ කිරීම්, සේවය අතහැරයාම ආදී කරුණු නිසා අයකර ගැනිමට නොහැකි බව වතුයායන් පවසයි. කෙසේ වෙතත් වතුයායන් වෙතින් ඉවත්වූ සේවකයින් අර්ථ සාධක අරමුදල් හා පාරිතෝෂික අරමුදල් ආපසු ලබාගැනීමට අදාලව තොරතුරු ලබා ගැනිම සඳහා වතු යාය වෙත පැමිණි සහ පැමිණෙන අවස්ථාවන් වලදි වතු යායන් විසින් එම හිඟ මුදල් අයකර ගැනීම ක්‍රියාත්මක වෙමින් පවති. රු. 252,185 වූ හිඟ උත්සව අත්තිකාරම් වල අදාල නිළධාරීන්ගේ නම හා හිඟ මුදල් සොයා ගැනීමට නොහැකි වී ඇත. අදාල නිළධාරීන්ගේ නාම ලේඛනය හා හිඟ මුදල් සොයා ඉදිරිපත් කරන ලෙස වතුයායන්ට දැනටමත් උපදෙස් දි ඇත. | විස්තර සොයා ගැනීම සිදු කර අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ II වන කොටසේ 5 (1) වන උප වගන්තිය | සේවකයකු විශ්‍රාම ගිය හෝ මරණයට පත් දින සිට දින 30ක් ඇතුළත පාරිතෝෂික ගෙවීම් කළ යුතු වුවත්, ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් එසේ සිදුකර නොමැත .තවද පාරිතෝෂික වශයෙන් අයවිය යුතු යම් මුදලක් | කාලාන්තරයක් තිස්සේ පවතින මූල්‍ය අර්බුදය හේතු කොටගෙන පාරිතෝෂික මුදල් නිසි පරිදි නොගෙවීම නිසා උසාවි මගින් ලබාදෙන නඩු තීන්දු මගින් ගෙවීම් | පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව නියමිත කාලයට පාරිතෝෂික ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ගෙවීම පැහැර හරින්නාවූ යම් සේවා යෝජකයකු පාරිතෝෂිකය ලෙස අයවිය යුතු මුදලට අතිරේකව පනතේ වගන්ති අනුව ගණනය කර අධිභාර ගෙවිය යුතුය .ඒ අනුව මණ්ඩලය විසින් පාරිතෝෂික මුදල් නියමිත දිනට නොගෙවීම හේතුවෙන් 2018 වර්ෂය අවසාන වන විට රු. 143,202,687 ක මුදලක් අධිභාර ලෙස ගෙවිය යුතුව තිබුණි. | කටයුතු කිරීමේදී අධිභාරය ගණනය කර පාරිතෝෂිත මුදල් ගෙවා ඇත. | |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය (i). මු.රෙ. 387 | වෙක්පත් මඟින් කෙරෙන සියලුම ගෙවීම් සඳහා තම බැංකු ශේෂ ප්‍රමාණවත්දැයි ගෙවන නිලධාරියා විසින් නිතරම සොයා බැලිය යුතු අතර, කිසිම ආණ්ඩුවේ බැංකු ගිණුමකින් අයිරා ගැනිම තහනම් බව දන්වා ඇතත්, ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් ලංකා බැංකුව, නේෂන් ට්‍රස්ට් බැංකුව සහ මහජන බැංකුව තුළ පවත්වාගෙන යනු ලබන ගිණුම් 4ක එකතුව රු.60,977,905ක මුදලක් 2018 වර්ෂය අවසානයට බැංකු අයිරා ලෙස පවත්වා ගැනීම හේතුවෙන් රු. 8,348,209ක අයිරා පොලියක් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. | නිරීක්ෂණ සමඟ එකඟ වී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අයිරා පහසුකම් මත ගෙවීම් කිරීමට කටයුතු නොකළ යුතුය. |
| | (ii). මු.රෙ. 395 (ඇ) | එක් එක් මාසයක් අවසානයේදී ඇති ගනුදෙනු සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම බැංකු සැසඳුම් පිළියෙල කළ යුතු වුවද, බැංකු ගිණුම් 10 ක් සඳහා බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි. | වර්තමානයේදි බැංකු සැසඳුම් වාර්තා පිළියෙල කර විගණනයට ඉදිරිපත් කරනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව බැංකු සැසඳුම් ප්‍රකාශන අදාල කාලය තුළ සැකසීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2009 අංක 09 ජාතිය ගොඩනැගීමේ බදු පනතේ (i) උපලේඛන I හි XIV වගන්තිය | කොළඹ තේ වෙන්දේසියේ විකිණීම සඳහා ලියාපදිංචි තැරැව්කරුවෙකුට සපයනු ලබන තේ මෙම පනත යටතේ බද්දෙන් නිදහස් වන නමුත් අනෙකුත් තේ අලෙවි ආදායම් බද්දට යටත් වේ. මේ අනුව මණ්ඩලය විසින් තේ වෙන්දේසියෙන් හැර පාරිභෝගික තේ අළෙවි ආදායම රු. 156,645,783 ක් බද්දට යටත් වේ.මේ අනුව සලකා බැලීමේදී | අනෙකුත් තේ අලෙවි ආදායම් මත ගෙවිය යුතු බදු ආයතනයේ පැවති මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් 2018 වර්ෂය තුළදී ජාතිය ගොඩනැගිමේ බදු ගෙවා නැත. | ජාතිය ගොඩනැගිමේ බදු පනතේ විධිවිධාන ප්‍රකාරව අලෙවි ආදායම් සඳහා බදු ගණනය කර ගෙවීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | බද්ද රු.3,132,915 කින් අවතක්සේරු කොට ගණනය කර තිබුණි. | | |
| | | අ | | |
| | (ii) 2 (i) (ඇ) වගන්තිය | වෙනත් ආදායම් ශීර්ෂ යටතේ ලබන ආදායම් බද්දට යටත් විය යුතු වුවද 2018 වර්ෂයේ රු.37,796,794ක ඉඩම් බදු කුලී ආදායම හා රු.2,368,987ක වෙනත් ආදායම් සඳහා ජාතිය ගොඩනැගීමේ බදු ගෙවීමට මණ්ඩලය කටයුතු සිදු කර නොතිබුණි. මේ හේතුවෙන් ජාතිය ගොඩනැගීමේ බද්ද රු.803,315 (40,165,781 * 2%) කින් අවතක්සේරු කොට ගණනය කර තිබුණි. | 2018 වර්ෂය සඳහා ඉඩම් හා බදු කුලී සඳහා ජාතිය ගොඩනැගීමේ බදු මුදල් ගෙවා නැත | 2009 අංක 09 ජාතිය ගොඩනැගීමේ බදු පනතේ විධිවිධාන ප්‍රකාරව ආදායම් සඳහා බදු ගණනය කර ගෙවීමට කටයුතු කළ යුතුය. |
| | (iii) 4 වන උප වගන්තිය | මණ්ඩලය ජාතිය ගොඩනැගීමේ බදු නියමිත දිනට ගණනය කර දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීම් කර නොතිබුණු බැවින් 2018 දෙසැම්බර් 31 දිනට රු.1,182,458ක හිඟ බදු පැවතුණි. | ආයතනයේ පැවති මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් 2018 වර්ෂය තුළදී ජාතිය ගොඩනැගීමේ බදු ගෙවා නැත. | 2009 අංක 09 ජාතිය ගොඩනැගීමේ බදු පනතේ විධිවිධාන ප්‍රකාරව ආදායම් සඳහා බදු ගණනය කර ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත (i). 2 වන වගන්තිය | කාර්තුවකට ආදායම රු.මි.10 ඉක්මවන සෑම ආයතනයක්ම බද්දට යටත් විය යුතු වුවත් මණ්ඩලය ඊට අනුරූපව කටයුතු කර නොමැති අතර , සලකා බලන මූල්‍ය වර්ෂයේදී සමස්ත පිරිවැටුම රු.818,735,838ක් වූ අතර මේ සඳහා ආර්ථික සේවා ගාස්තුව වශයෙන් රු.2,046,839 (818,735,838*0.25%) ගෙවිය යුතු වුවත්, එසේ සිදු කොට නොතිබුණි . මීට අමතරව තවත් රු.6,357,269ක් ශේෂ පත්‍රයේ ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු ලෙස දිගින් දිගටම පෙන්නුම් කර තිබුණි. | 2012 වර්ෂයේ සිට පාලන අධිකාරියේ තීරණය මත ගෙවීම අත්හිටුවන ලදි. | 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) 6 වන උප වගන්තිය | බද්දට යටත් පිරිවැටුම ඉක්මවන සෑම ආයතනයක්ම කාර්තුව අවසන් වී එළඹෙන මාසයේ 20 වන දින හෝ ඊට පෙර ආර්ථික සේවා ගාස්තු ගෙවිය යුතු වුවත්, මණ්ඩලය 2012 වර්ෂයේ සිට | 2012 වර්ෂයේ සිට පාලන අධිකාරියේ තීරණය මත ගෙවීම අත්හිටුවන ලදි. | 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | 2019 මූල්‍ය වර්ෂය දක්වා වාර්තා භාර දීම හෝ ගාස්තු ගෙවීමක් සිදු කොට නොතිබුණි .තවද පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව යම් සේවා ගාස්තුවක් පනතේ 6 වෙනි වගන්තිය ප්‍රකාරව නිශ්චිත දක්වා ඇති දින හෝ ඊට පෙර යම් කාර්තුවකට අදාල සේවා ගාස්තුව හෝ ඉන් කොටසක් නොගෙවා ඇති විටෙක එය පැහැර හරිනු ලැබූ ලෙස සලකන අතර, මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂකවරයකුටම හෝ වෙනත් ප්‍රධාන නිලධාරියකුට පනතේ කාර්යය සඳහා පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය හැකිය. | | |
| (ඉ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනතේ<br>(i). 90 වන වගන්තිය | පුද්ගලයකු හෝ හවුල් ව්‍යාපාරයක් ස්වයං තක්සේරු පදනම මත කාර්තුවක් අවසානයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පිළිවෙලින් අගෝස්තු 15, නොවැම්බර් 15, පෙබරවාරි 15 හා ඊළඟ වර්ෂයේ මැයි 15 වන දින හෝ ඊට පෙර ආදායම් බදු ගෙවිය යුතුය . ඉතිරි බදු මුදලක් වෙතොත් එය ඊළඟ වර්ෂයේ සැප්තැම්බර් 30 දින හෝ ඊට පෙර ගෙවිය යුතුය නමුත් මණ්ඩලය 2018 තක්සේරු වර්ෂයට අදාල ආදායම් බදු 2021 ජුනි 22 දින වන විටත් ගෙවා නොමැති අතර, ආදායම් බදු වගකීම ද ගණනය කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | දේශීය ආදායම් බදු පනත ප්‍රකාරව ආදායම් බදු වගකීම ගණනය කර ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය. |
| | (ii) 93 වන වගන්තිය | සෑම තක්සේරු වර්ෂයක්ම අවසන් වීමෙන් පසුව මාස 08 කට නොඅඩු කාලයක් තුළ එම තක්සේරු වර්ෂය සඳහා ආදායම් වාර්තාවක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට භාර දිය යුතු වුවත් මණ්ඩලය, 2018/2019 තක්සේරු වර්ෂයට අදාල ආදායම් බදු වාර්තාව 2021 ජුනි 22 දින තෙක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට භාර දී නොතිබුණි. | බදු වාර්තා භාරදීමට කටයුතු කරනු ඇත. | දේශීය ආදායම් බදු පනත ප්‍රකාරව ආදායම් බදු වාර්තා නියමිත කාලයට ඉදිරිපත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 15 වන වගන්තිය | සේවකයෙකුගේ සේවා යෝජක විසින්,මෙම පනත යටතේ එබඳු සේවකයකුගේ හැම මාසයකම දායක මුදල ඒ සේවකයාගේ ඉපයීම් වලින් අඩු කොට ඊළඟ මාසයෙහි අන්තිම දිනට පෙර අරමුදලට ගෙවිය යුතුය. නමුත් මණ්ඩලය එලෙස 2001 වර්ෂයේ සිට වසර 17 කට ආසන්න කාලයක් සඳහා නොගෙවූ රු.342,193,295 මුදලක් ගෙවිය යුතු අර්ථසාධක ලෙස පැවතුණි. | 2001 වර්ෂයේ සිට පැවති මූල්‍ය දුෂ්කරතාවය හේතුකොට ගෙන නියමිත දිනට සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් ගෙවීම අත්හිටුවන ලදී. භාණ්ඩාගාරයෙන් මුදල් ලද විට සහ නඩු තීන්දු මගින් නියම කරනු ලබන දායක මුදල් ගෙවා ඇත. | සේවක අර්ථසාධක අරමුදල් පනත ප්‍රකාරව නොගෙවූ අර්ථ සාධක දායක මුදල් ගෙවීමට කඩිනම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (උ) | 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ (1) 16 වන උප වගන්තිය | සෑම සේවා නියුක්තයකුට සේවා යෝජක විසින් ඒ සේවා නියුක්තයා තම සේවයෙහි නියුක්ත කරනු ලබන එක් එක් මාසය වෙනුවෙන්, ඒ මාසය ඇතුළත ඒ සේවා යෝජකගේ සේවයෙහි නියුක්ත වීමෙන් ඒ සේවා නියුක්තයා උපයන මුළු ඉපයීම්වලින් සියයට තුනකට පමණ වන දායක මුදලක් ඊළඟට එළඹෙන මාසයේ අවසාන දින හෝ එදිනට පෙර ඒ සේවා නියුක්තයා සම්බන්ධයෙන් අරමුදලට ගෙවීමට සේවා යෝජකයා යටත් විය යුතු වුවද මණ්ඩලය විසින් 2011වර්ෂයේ සිට වසර 7කට ආසන්න කාලයක් සඳහා නියුක්තයන්ගේ භාර අරමුදලට ගෙවිය යුතු රු.29,691,739 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයටද ගෙවීම් කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | සේවානියුක්තයන්ගේ භාර අරමුදල් පනත ප්‍රකාරව දායක මුදල් නියමිත කාලවකවානු වලදී ගෙවීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 477,742,649 ක අලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අලාභය රු. 381,022,523 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 96,720,126 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආයතනයේ පෙර වර්ෂයට සාපේක්ෂව පාරිභෝජ්‍ය තේ විකුණුම් ආදායම රු. 178,475,834කින් අඩුවීමත්, රබර් විකුණුම් ආදායමරු. 40,949,262කින් අඩුවීමත්, තේ දළු සහ තේ තොග වලට අදාල විකුණුම් පිරිවැය රු. 66,971,610 කින් වැඩි වීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ තේ දළු විකිණීමෙන් ලද ආදායම 2017 වර්ෂයට සාපේක්ෂව රු.35,168,636කින් එනම් සියයට 6.7කින් අඩුවී ඇති අතර, තේ,රබර් සහ වෙනත් භෝග වලින් ලැබෙන ආදායම් 2017 වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් රු.178,475,834කින්, රු.40,949,262කින් හා රු.25,463,756 කින් එනම්

පිළිවෙලින් සියයට 53ක්, සියයට 20ක් සහ සියයට 55කින් අඩුවී ඇති අතර, 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ තේ දළු, ජන තේ ,රබර් හා වෙනත් භෝග වගාවන්ට අදාල පිරිවැය පිළිවෙලින් රු.66,971,610ක්, රු.73,743,967ක්, රු.154,879,673ක් සහ රු.1,712,488කින් වැඩිවී තිබුණි. එම පිරිවැය වැඩිවීම ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 6ක්, සියයට 51ක්, සියයට78 ක් සහ සියයට 83ක් ලෙස නිරීක්ෂණය විය.

**2.3 අනුපාත විශ්ලේෂණය**

2017 වර්ෂයේ දී හා 2018 වර්ෂයේදී මණ්ඩලයේ ජංගම වත්කම් අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය 1:0.3 ක් වී ඇති අතර එමගින් මණ්ඩලයට තම ජංගම වත්කම් වලින් එහි ජංගම වගකීම් පියවීමේ හැකියාවක් නොමැති බවත්, මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම අවදානම් තත්ත්වයක ඇති බවත් නිරීක්ෂණය විය. එමෙන්ම ඉහත අනුපාත තවදුරටත් විශ්ලේෂණය කිරීමේදී මණ්ඩලයේ දළ අලාභ අනුපාතය සියයට 21 සිට සියයට 43 ක් දක්වාත් ශුද්ධ අලාභ අනුපාතය සියයට 35 සිට සියයට 58 ක් වූ අගයකින් තවදුරටත් අයහපත් වී තිබුණි.

**3. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**3.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ ගිණුම් අංශයට අනුයුක්තව ගිණුම්කරණ හා මූල්‍ය කළමනාකරු, උපදේශකවරයකු,ගණකාධිකාරිවරුන් දෙදෙනෙකු හා නිලධාරින් 11 දෙනෙකු සේවය කරන අතර, ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.මි. 10.11 ක වැටුප් හා දීමනා ගෙවා තිබූ නමුත්, 2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය පරිදි 2017 හා 2018 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2019 ඔක්තෝබර් 31 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වී ඇත. | මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**3.2 විගණන කමිටුව**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය 7.4.1 වගන්තිය ප්‍රකාරව මාස 03කට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රැස්වීම් 02ක් පමණක් පවත්වා තිබුණි. | පිළිගනිමි. 2018 වසරේ අවසන් කාර්තුවේ රටේ පැවති දේශපාලන අස්ථාවරභාවය නිසා අධ්‍යක්ෂක මණ්ඩල වෙනස් වීම් හේතුවෙන් විගණන කමිටු පැවැත්වීමට නොහැකි වූ බව දැනුම් දෙමි.තවද 2017 වසරේ කමිටු රැස්වීම් 4 ක්ද 2019 වසරේ මේ වන විට කමිටු රැස්වීම් 03ක් ද පවත්වා ඇත. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පවත්වා ඒ තුළින් අභ්‍යන්තර පාලන සහ යහපාලන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |